# විදුදය

60 ANNIVERSARY

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට සැට වසරක් පිරීම නිමිත්තෙනි

පළමුවන මුද්‍රණය : 2019

විදුදය ශාස්ත්‍රීය සංග්‍රහය

උපදේශකත්වය : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග

© සංස්කාරකවරු : කුසුමලතා ලංකාමුල්ල
ජයලතා මැදවත්ත

සංස්කරණ සහාය : එම්.භාග්‍යා දිල්හානි
ආර්. ජේ. සඳුනිකා රත්නායක
එච්. පී. ටී. නදීරා
ජී. කේ. එන්. රුවිනි

ISSN 2235-9001

සම්බන්ධීකරණය : චාමි නිලාශා පටබැඳිගේ

පිටකවරය : ප්‍රතිනිර්මාණය : ෂෙලින්ත පී. ජීවන්ත

මුද්‍රණය : කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
දු.ක. +94 114 870333

ප්‍රකාශනය : විදුදය ප්‍රකාශනයකි.

# විදුදය

## ශාස්ත්‍රීය සංග්‍රහය

**සංස්කරණය**

කුසුමලතා ලංකාමුල්ල
ජයලතා මැදවත්ත

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල,
නුගේගොඩ.
2019

18. දහනව වන සියවස අගභාගයේ බෞද්ධ පුනරුද ව්‍යාපාරය කෙරෙහි විද්‍යෝදය පිරිවෙණෙන් ලද දායකත්වය — 289-315
මහාචාර්ය එස්.ඩී.එන්. ධර්මරත්න
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

19. ඌව - වෙල්ලස්ස නිදහස් අරගලයේ සටන් නායකයන්ට අත් වූ ඉරණම — 316-338
දමිත් රණගල
කථිකාචාර්ය
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

20. සංවර්ධන සන්නිවේදනයේ මූලික අවශ්‍යතා පිළිබඳ සංවර්ධන ප්‍රවේශය හා ප්‍රායෝගික ජන සමාජය — 339-346
ආර්.ජේ.සඳුනිකා උදානි රත්නායක
සහකාර කථිකාචාර්ය
සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

21. වාර්තා චිත්‍රපට කලාවේ ප්‍රභවය හා විකාශනය — 347-350
එච්.පී. තිළිණි නදීරා
සහකාර කථිකාචාර්ය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

22. කලා විචාරයට බුදු දහමින් ලැබෙන පිටුබලය - ධම්මපදය ඇසුරෙන් — 351-359
ඩී.කසුන් දර්ශන ජයසිංහ
සිංහල විශේෂවේදී අවසන් වසර
සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

23. අමරදාස වීරසිංහයන්ගෙන් වියෝ වූ "සංස්කෘති" — 360-369
ප්‍රේමරත්න සමරනායක
ආරාධිත කථිකාචාර්ය
කැලණිය සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

24. **What is the Purpose of Education?** — 370-372
Dr. E.W. Adikaram
The first Chancellor of University of Sri Jayewardenepura
Translated by Ravi Palihawadana

25. **Traditional communication patterns exist in the matrimonial customs of the Muslim culture** — 373-378
Sunil Derangala
Senior Lecturer
Department of Sinhala and Mass Communication

26. අපේ පැරණි දැන්වීම් කලාව : ප්‍රවාහන මාධ්‍යය ඉලක්ක කරගත් දැන්වීම් — 379-389
හංසමාලා රිටිගහපොල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

27. අනෝර මාරාව (කෙටිකතාව) — 390-396
ජී.කේ. නිලේෂා රුවනි
සහකාර කථිකාචාර්ය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# ඌව - වෙල්ලස්ස නිදහස් අරගලයේ සටන් නායකයන්ට අත් වූ ඉරණම

කථිකාචාර්ය දමිත් රණගල

බලවත් යුරෝපා ජාතීන් වූ පෘතුගීසීන්,[1] ලන්දේසීන් සහ ඉංග්‍රීසීන් අවිබලයෙන් උඩරට රාජ්‍ය අල්ලා ගැනීමට ගත් සියලු උත්සහයන් උඩරැටියන් දිවි හිමියෙන් ව්‍යාර්ථ කළහ. ක්‍රි.ව. 1803 දී සර් ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ උඩරට ආක්‍රමණය අන්ත පරාජයකින් කෙළවර වීම ඊට එක් නිදර්ශනයකි.[2] මෙලෙස ඉංග්‍රීසීන් පවා අවිබලයෙන් යටත් කරගැනීමට අසමත් වූ උඩරට රාජ්‍යයට ක්‍රි.ව. 1815 දී උඩරැටියන් විසින්ම ඉංග්‍රීසීන් කැඳවා ගනු ලැබීම දෛවෝපගත සිදුවීමකි.[3] ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ මර්දනකාරී පාලනයෙන් මිදීම එලෙස ඉංග්‍රීසීන් කැඳවා ගැනීමේ අභිලාෂය විය. එහිදී ඔවුන් එහි පැළපදියම් වනු ඇතැයි උඩරැටියන් කිසිවිටකත් නොසිතූහ. "නුඹලා විසින් රජු බලයෙන් පහ කොට අවසන්ය. නුඹලාට කිරීමට තවත් කිසිවක් මෙහි නැත. ඒ නිසා දූන් නුඹලාට පිට වී යා හැකිය" යැයි උඩරට වැසියෙක් කළ ප්‍රකාශයක් පිළිබඳ හෙන්රි මාෂල් කර ඇති සඳහනින් ඉංග්‍රීසීන් ලවා කෲර ක්‍රියා කළ රජු සිංහාසනයෙන් නෙරපා දැමීම හැර වෙනත් කිසිඳු අභිලාෂයක් උඩරැටියන් තුළ නොවූ බව පැහැදිලි වේ.[4] එහෙත් 1815 පෙබරවාරි 18වන දින මැදමහනුවර සිට සැතපුමක් එපිට වූ ගල්ලැහැවත්ත පිහිටි උඩුපිටිය ආරච්චිගේ නිවසේ දී රජු අත්අඩංගුවට ගත් ඉංග්‍රීසීහු ලහි ලහියේ සකස්

1 පෘතුගීසීන් 1594 - දන්තුරේ, 1603 - බලන, 1630 - රන්දෙණිවෙල, 1638 - ගන්නෝරුව සටන්වලින් උඩරට රාජ්‍ය ආක්‍රමණයට උත්සහ කොට බලවත් පරාජයන්ට ලක්විය. ජයතිලක නෙළුම්, කන්ද උඩරට සටන් හා ආරක්ෂක විධිවිධාන (ක්‍රි.ව. 1521-1658 දක්වා පෘතුගීසීන් සම්බන්ධව), සමන්ති පොත් ප්‍රකාශකයෝ, හෙටිටිගම ජා-ඇල, 2013, පිට 123.

2 සිල්වා කොල්වින් ආර්. ද, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව (1795-1833), සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගමේ මුද්‍රණය, 1958, පිටු 118-123.

3 ජෝන් ඩොයිලිගේ වචනයෙන්ම ප්‍රකාශ කළ හොත් කුඩැල්ලකුගෙන් තරමටවත් හිංසාවක් ඉංග්‍රීසි හමුදාවන්ට මේ අවස්ථාවේ දී උඩරැටියන්ගෙන් සිදු නොවිය.

4 Marshall Henry, Ceylon: A General Dedcription of the Island and its Inhabitants. Repr. Kandy, 1954, p 134



කළ ගිවිසුමක් මඟින් උඩරට රාජ්‍යයේ බලය සියතට ගත්හ.[5]

"ක්‍රිස්තු වර්ෂයෙන් වර්ෂ එක්වා දහස් අටසිය පහළොවක් වූ මාර්තු මස දෙවැනි දින නොහොත් සිංහල වර්ෂ ප්‍රමාණයෙන් ශක වර්ෂ එක්වා දහස් සත්සිය තිස් හයට පැමිණි අවුරුද්දේ නවම් මස අවසතවක් නම් තිථිය ලත් ගුරු දින සෙංඛඩ ශෛලාභිධාන පුරප්‍රවරයෙහි මාලිගා අභ්‍යන්තරයට එක් වූ සම්මුතියේ දී.." යනාදි වශයෙන් ඇරඹෙන 1815 දී ඉංග්‍රීසීන්ට මෙරට නතු කර දුන් වගන්ති දොළොසකින් සමන්විත එම ගිවිසුම මඟින් මුල්වරට මුළු ලංකාද්වීපයම පරහස්ත ගත විය.[6] කිසිම උඩරට ප්‍රධානියෙක් මාර්තු දෙවන දින මෙම ගිවිසුමට අත්සන් නොකළහ.[7] උඩරට ප්‍රධානීන් විසින් ඒ සඳහා අත්සන් තැබුයේ ඒ මස 10 වැනි දින සහ 18 වැනි දින දෙක තුළදීය.[8]

මෙම උඩරට ගිවිසුම වූ කලී ඇහැලේපොල මහ නිලමේගේ බලාපොරොත්තු මහත් සේ කඩවීමකි.[9] ඇහැලේපොල රජ වනු දැකීමට බොහෝ රදළයන්ගේ මනාපයක් නොතිබුණ ද ශ්‍රී වික්‍රම රාජසිංහ වෙනුවට වෙනත් රාජවංශිකයෙකු උඩරට සිහසුනට පත්වනු දැකීම ඔවුන්ගේ අපේක්ෂාව ද විය. තමන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කළ හැකි

5 සිල්වා කොල්වින් ආර්. ද, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව (1795-1833), සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගමේ මුද්‍රණය, 1958, පිට 174.

6 හේමපාල නුවරඑළියේ, උඩරට ගිවිසුම, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, ඇන්. ටී. පෙරේරා මාවත, මුල්ලේරියාව, 2004, පිටු 19-39.

7 අස්ගිරි පාර්ශවයේ භික්ෂුවක් වූ වාරියපොල සුමංගල හිමියෝ ගිවිසුම අත්සන් කිරීමට පෙර උද්දාමයට පත් ඉංග්‍රීසි සෙබළු විසින් ඉහළ නංවා තිබූ ඉංග්‍රීසි කොඩිය කීමට ඇද දමා පාගා යළි සිංහ ධජය එසවීම මාර්තු දෙවන දින සිදු වූ සුවිශේෂ සිදුවීමකි. අධිනීතිඥ වෝල්ටර් විමල්චන්ද්‍ර මහතා සතුව තිබූ පත් ඉරු 31කින් යුත් පුස්කොළ පොතකින් මෙකී පුවතේ ඓතිහාසිකත්වය පූජ්‍යපාද කුඹුල්ලේ සීලක්ඛන්ද නාහිමියන් පෙන්වා දී ඇත. එම. පිටු 50-51.

8 මෙහිදී ඇහැලේපොල නිලමේගේ අත්සන ගිවිසුම සඳහා ලබා ගැනීම සඳහා මාර්තු මස 18 වන දින ඉංග්‍රීසීන්ගේ උඩරට නියෝජිතයා වූ ජෝන් ඩොයිලිට ඔහුගේ වලව්වටම යාමට සිදුවිය.

9 ඉංග්‍රීසීන් විසින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පන්නා දමා තමා සිහසුනට පත් කරනු ඇතැයි ඇහැලේපොල නිලමේ අපේක්ෂා කළහ. සිල්වා කොල්වින් ආර්. ද, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව (1795-1833), සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගමේ මුද්‍රණය, 1958, පිට 178.

දෘශ්‍ය මාන බෞද්ධ රජ කෙනෙකු වෙනුවට මුහුදින් එතෙර, කිසිදා නොදුටු අබෞද්ධ රජෙකුගේ සේවකයන් පිරිසකගේ නියෝගයන්ට නතු වීමට උඩරට සෑම පන්තියකටම සිදුවිය. රදළයන්ගේ මහේශාක්‍ය බව ද, වරප්‍රසාද සහ තාන්න මාන්න ද ඉංග්‍රීසීන්ගේ පාලනය යටතේ හැල්ලු වී ගියේය. පහළ පෙළේ ඉංග්‍රීසි සොල්දාදුවන් පවා තමන්ට ගරු සරුවක් නොදක්වා උඩඟු ලෙස හැසිරෙන ආකාරය දෙසබලා මැසිවිලි නැඟීම හැරණු විට වෙනත් කළ හැකි කිසිවක් ඔවුන්ට නොවීය.[10] බෞද්ධාගම කඩනොකොට ආරක්ෂා කරන බවට ගිවිසුමේ පස්වන වගන්තියෙන් පොරොන්දු වුව ද ඉංග්‍රීසීන් යටතේ බෞද්ධාගම මෙන්ම භික්ෂූන් වහන්සේලා ද ඉතා නොවැදගත් තැනට වැටෙන බව භික්ෂූහු තේරුම් ගත්හ. තවද උඩරට සමාජය තුළ චිරාත් කාලයක් මුල් බැස ගෙන තිබූ චාරිත්‍රවාරිත්‍ර ගැන නොසලකා ඉංග්‍රීසි ක්‍රමයට උඩරට සමාජය පාලනය කිරීමට යාම නිසා ද අවුල් සහගත තත්ත්වයක් ඇති විය. ''උඩරට රාජ්‍යයේ බ්‍රිතාන්‍ය පාලනය වනාහි, එකම නගුලකට, මී හරකෙක් හා එළ හරකෙක් යෙදීම වැනි විෂම වූවකැ''යි එක් ගම් පාලකයෙකු කළ ප්‍රකාශයෙන් පැවති අවුල් සහගත තත්ත්වය මනාව තේරුම් ගත හැකිය.[11] ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනෙන් නෙරපා දැමීමට එකතු වූ උඩරට රදළවරු, භික්ෂූන් වහන්සේ හා මහජනයා වැඩිකල් යාමට පෙර ගිය නුවණ ඇතුන් ලවාවත් ඇදගත නොහැකි බව වටහා ගත්හ.

මේ පසුබිම තුළ උඩරට රදළයන් ද භික්ෂූන් වහන්සේ ද වැසියන් ද අතරින් කිහිප දෙනෙකු එක් වී ඉංග්‍රීසීන් උඩරටින් පන්නා දැමීමට 1816 වර්ෂයේ දී රහස් ප්‍රයත්නයක් ගන්නා ලද මුත් එක්නැලිගොඩ නිලමේ එම වර්ෂයේ ජූලි මස 18 වන දී පමණ කළ පාවාදීම හේතුවෙන්

10 එමෑ 184.

11 "ඔවුන් සහ අප අතර කිසිම පෑහීමක් නොවීය, අපව එකට ළං කළා වූ එකම සාධකයක් හෝ නොතිබුණ අතර අප දුරස් කිරීමට හේතු වූ සාධක අපමණ තිබුණි" යැයි ජෝන් ඬේවි සිදු කර ඇති ප්‍රකාශය ද පැවති එම ව්‍යාකූල තත්ත්වය මනාව පැහැදිලි කරයි. Devy John, An Account of the Interior of Ceylonind its Inhabitants, London, 1821, p 14.



මෙම ප්‍රයත්නය ව්‍යාර්ථ කිරීමට ඉංග්‍රීසිහු සමත් වූහ.[12] එම අසාර්ථක ප්‍රයත්නයෙන් පසුව උඩරට ඉංග්‍රීසි පාලනය බිඳ දමා ස්වදේශිකයන්ගේ රජයක් පිහිටුවීමේ අදහසින් ඌව වෙල්ලස්ස කේන්ද්‍ර කරගනිමින් නැවත වරක් අරගලයක් දියත් විය. 1817 වර්ෂයේ ඔක්තෝම්බර් මස අරඹා 1818 නොවැම්බර් දක්වා මුළු උඩරට ප්‍රදේශය පුරාම වාගේ ව්‍යාප්ත වී ගිය එම අරගලය ඉංග්‍රීසි පක්ෂය කැරැල්ලක්[13] ලෙස අර්ථ ගැන්වුව ද එය වනාහි ඉංග්‍රීසි පාලනයට එරෙහිව සිංහලයන් දියත් කළ 'ප්‍රථම නිදහස් සටන'[14] වශයෙන් හැඳින්වීම එම අරගලයට උරදුන් වීරෝධාර දේශප්‍රේමීන්ගේ නාමයට ද කෙරෙන මහත් වූ ගෞරවයකි. උඩරට බහුතරයක් රදළවරුන්,[15] බෞද්ධ භික්ෂූන් වහන්සේලා, සාමාන්‍ය ජනතාව සහ වැදි ජනතාව ද 1818 ඌව වෙල්ලස්ස නිදහස් සටනේ කොටස් කරුවන් වූහ. සටන සඳහා නායකත්වය රදළ නායකයින් සහ බෞද්ධ භික්ෂූන් වහන්සේ විසින් ලබා දුනි. සටන හා එක් වූ රදළයින් දිසාවේ, රටේ අදිකාරම්,

12 ඉහගම කුමන්ත්‍රණය වශයෙන් ද හැඳින්වෙන බ්‍රිතාන්‍ය විරෝධී මෙම පෙළගැස්ම ඉහගම උන්නාන්සේ සහ මඩුගල්ලේ උඩගබඩා නිලමේගේ මූලිකත්වයෙන් සිදුවිය. බුරුම රටින් රාජ කුමාරයෙකු ගෙන්වා ගෙන උඩරට සිහසුනට පත් කිරීම මොවුන්ගේ අභිලාෂය වී පැවතුණි. විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිටු 1-62.

13 1817 නොවැම්බර් මස 07 (අංක 248), නොවැම්බර් 27 (අංක 251), දෙසැම්බර් 15 (අංක 255), දෙසැම්බර් 28 (අංක 258) දාතම සහිතව රොබට් බ්‍රවුන්රිග් විසින් බැතර්සිට් වංශාධිපතිතුමාට යොමු කළ ලිපිවල මෙම නිදහස් සටන බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි කැරැල්ලක් වශයෙන් හඳුන්වා ඇත. එමෑ පිටු 81-117.

14 එහෙත් 1818 සටන් සමයේ මහනුවර ප්‍රධාන වෛද්‍ය නිලධාරියා වශයෙන් සේවය කළ හෙන්රි මාෂල් කිසිම පැකිලීමකින් තොරව මෙම අරගලය නිදහස් සටනක් ලෙස හඳුන්වා ඇත. ඇඳගම මාලනී, ''යටත් විජිත වාදය හා ස්වදේශීන්ගේ ප්‍රතික්‍රියා'' ශ්‍රී ලාංකේය ඉතිහාසය, හතරවන වෙළුම, ඩබ්. කේ. එම්. විජේතුංග (සංස්‍), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 12, 2012, පිටු 130-131.

15 එහෙත් මොල්ලිගොඩ, එක්නැලිගොඩ, දිඹුලාන, දෙහිගම, මහවලතැන්නේ වැනි නිලමේවරු කිහිප දෙනෙක් ඉංග්‍රීසි පක්ෂය ගෙන නිදහස් සටන බිඳ හෙළීමට වර්තමානයේ ඇතැම් ජාතිද්‍රෝහීන් සේ කටයුතු කරන ලදී. නිදහස් සටන අවසානයේ 1818 නොවැම්බර් මස 21 වන දින නිකුත් කළ රාජාඥාවේ 22 වන වගන්තියෙන් ඔවුන්ගේ ඉඩම් බද්දෙන් නිදහස් කිරීමට ද කටයුතු කර ඇත. ඬේවි දුටු ලංකාව, ඇල්ලේපොළ එච්. ඇම්. සෝමරත්න (පරි.), විසිදුනු ප්‍රකාශකයෝ, වැව පාර, බොරලැස්ගමුව, 2013, පිට 444.

මොහොට්ටාල, රටේ රාල, ගමැති රාල, රෙහෙන රාල, විදානේ වැනි විවිධ තරාතිරම්වලට අයත් වූහ.[16] මොවුන්ගේ එකම අරමුණ වූයේ ඉංග්‍රීසි පාලනය උඩරටින් තුරන් කොට සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කරන පාලකයෙකු උඩරට සිහසුනට පත්කර ගැනීමයි.

සටන මැනවින් සංවිධානය වී නොතිබීම, ඒවා හුදකලා සටන් බවට පත් වීම, රදළ නායකයින් අතර පැවති පුද්ගලික අමනාපකම් මෙ බැරෑරුම් අවස්ථාවේ දී පවා අත් නොහැරීම, රාජ ප්‍රතිරූපකයාට රාජ්‍ය උරුමයක් නොමැති බව හෙළි වීම සහ ඉංග්‍රීසින් 'මාර්ෂල් ලෝ' හෙවත් යුද්ධ නීතිය[17] පනවා නිදහස් සටන දැඩි ලෙස මර්දනය කිරීම[18] තුළ ඉහත අරමුණ බිඳ වැටුණි.

මෙහි ප්‍රතිඵල විමසන කල, 1818 ඌව වෙල්ලස්ස නිදහස් සටන උඩරට රදළ ප්‍රධානීන්ගේ ඉරණම කෙරෙහි බෙහෙවින් බලපෑවේය. එහි දී ඌව වෙල්ලස්ස සටනට උරදුන් රදළ නායකයින්ට සහ භික්ෂූන් වහන්සේට අත් වූ ඉරණම අංශ කිහිපයක් යටතේ විග්‍රහ කළ හැකිය. එනම්,

- සටනට සම්බන්ධ නායකයන් කැරැලිකරුවන් ලෙස නම් කොට දේපොළ රාජ සන්තක කිරීම.

16 දිසානායක ජේ. බී., ''පළමු නිදහස් සටන මෙහෙයවූවෝ කවරහු ද?'', පළමු නිදහස් අරගලයේ ප්‍රත්‍යාවලෝකනය, රංග කලන්සූරිය, ප්‍රදීප් එන්. වීරසිංහ (සංස්:), රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 05, පිටු 14-15.

17 1818 පෙබරවාරි මස 21 වන දින, මුළු උඩරට පළාත්වලටම යුද්ධ නීතිය ප්‍රකාශ කරන ලදී. සිල්වා කොල්වින් ආර්. ද, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව (1795-1833), සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගමේ මුද්‍රණය, 1958, පිට 199.

18 ''යම් කිසි පෙදෙසක කැරැල්ල පැන නැඟුණු විට එහි යුද මුරපොළවල් එකක් හෝ කීපයක් හෝ පිහිටුවන ලදී, යුද්ධ නීතිය ප්‍රකාශ කැරිණි, විරෝධය පෑ වැසියන්ගේ ගේදොර ගිනි තබන ලදී, බොහෝ විට ප්‍රයෝජනවත් ගස් කපා හෙළන ලදී, කුඩා බට පිරිස් රට හැම තැන ම සතුරන් සොයමින් ගමන් කළහ. විරෝධය පැවුන් හා ආයුධ දරා සිටි හැම දෙනම මරා දැමීමට ඔවුන්ට අවසර තිබිණ.'' වශයෙන් 1818 පළමු නිදහස් සටන ඇසින් දුටු ජොන් ඩේවි සිදුකර ඇති විස්තරයෙන් ඉංග්‍රීසින් සටන් මර්දන කිරීම සඳහා අනුගමනය කළ කුරිරු ප්‍රතිපත්තිය හෙළි වේ. ඩේවි දුටු ලංකාව, ඇල්ලේපොළ එච්. ඇම්. සෝමරත්න (පරි.), විසිදුනු ප්‍රකාශකයෝ, වැව පාර, බොරලැස්ගමුව, 2013, පිට 292.



- සටන් අතරතුර තුවාල ලැබීම හෝ මරණයට පත් වීම.
- බන්ධනාගාර ගත කිරීම.
- මරණීය දණ්ඩනය පැණවීම.
- රටින් පිටුවහල් කිරීම.
- ස්ව කැමැත්තෙන් ඉංග්‍රීසීන්ට යටත් වීම.

1818 ඌව වෙල්ලස්ස සටන පැවති කාලය පුරාම විටින් විට රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශනයන් (Proclamation) මඟින් නිදහස් සටන හා සම්බන්ධ විවිධ තරාතිරමේ උඩරට රදළවරුන්, භික්ෂූන් වහන්සේ, වැසියන් 'රාජද්‍රෝහී' කැරැලිකරුවන්, සාහසික අපරාධකරුවන් ලෙස ප්‍රකාශයට පත් කොට ඔවුන්ගේ ඉඩකඩම් හා දේපළ රාජසන්තක කරන බවට ආඥා නිකුත් කොට තිබේ. 1818 ජනවාරි මස 10 වන දින නිකුත් කළ එබඳු ප්‍රකාශනයකින් ඌවේ, වලපනේ සහ වෙල්ලස්සේ පහත සඳහන් පුද්ගලයන් දහනව දෙනා කැරැලිකරුවන් ලෙස නම් කොට දේපළ රාජසන්තක කරන බව නිවේදනය කොට තිබේ.[19] (01. ඡායාරූපය)

<u>ඌවේ</u>

01. කැප්පෙටිපොළ දිසාව
02. ගොඩගෙදර රටේ අදිකාරම
03. කැටකාල මොහොට්ටාල
04. කතරගම මහ බෙත්ම රටේ රාල
05. කතරගම කුඩා බෙත්ම රටේ රාල
06. පලංගොල්ල මොහොට්ටාල
07. වත්තෙකැලේ මොහොට්ටාල
08. පොල්ගහගෙදර රෙහෙන රාල
09. පෝස්රේවත්තේ විදානෙ

19 කලන්සූරිය රංග, වීරසිංහ ප්‍රදීප් එන්., පළමු නිදහස් අරගලයේ ප්‍රත්‍යාවලෝකනය, (සංස්:), රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 05, පිට 08.

වලපනේ

10. කිවුලේගෙදර මොහොට්ටාල
11. කළුගමුවේ මොහොට්ටාල
12. උඩමාදුරේ මොහොට්ටාල

වෙල්ලස්සේ

13. කොහුකුඹුරේ රටේ රාල
14. කොහුකුඹුරේ වලව්වේ මොහොට්ටාල
15. බූටාවේ රටේ රාල
16. බකිනිගහවෙල රටේ රාල
17. මහ බදුල්ල ගම්මානේ රටේ රාල
18. බුළුපිටියේ මොහොට්ටාල
19. පල්ලේ මල්හෙයායේ ගැමති රාල

1818 ජූලි මස 08 වන දින ප්‍රකාශයට පත් කළ තවත් ලේඛනයක ගන්අට පළාතේ, පල්ලේ පළාතේ සහ උඩපළාතේ පුද්ගලයන් 36 දෙනෙක් ද සැප්තැම්බර් මස 14 වැනි දින ප්‍රකාශයට පත් කළ ලේඛනයක පුද්ගලයන් 08 දෙනෙක් කැරැලිකරුවන් ලෙස නම් කොට දේපළ රාජසන්තක කරන බව නිවේදනය කර තිබේ.[20] ඉංග්‍රීසීන් විසින් කැරැලිකරුවන් ලෙස නම් කොට රාජසන්තක කළ නිදහස් සටනේ විරුවන්ගේ ඉඩකඩම් හා දේපළ "එසේ රාජසතු උන ගන්බින්වලින් සහ අනිකුත් දේපල වලිනුත් ඒ අයවල් නොහොත් එයින් කෙනෙක් අල්ලා නඩු විබාගය පිණිස ගෙනැත් බාර දෙන්ඩ යෙදෙන අයවලට ලැබෙනවා ඇත"[21] වශයෙන් ඔවුන් අල්ලා ගැනීම පිණිස ඉංග්‍රීසීන්ට සහය වන අයට ප්‍රදානය කරන බවද සඳහන් කර ඇත. සටන් නායකයන් අල්ලා ගැනීමට ස්වදේශිකයන්ගේ සහයා ලබා ගැනීම එහි අරමුණ වූ බව නොරහසකි. මෙලෙස කැරැලිකරුවන් ලෙස ඉංග්‍රීසීන් නම් කළ උඩරට සටන් නායකයන් අතරින් ඇතමෙක්

20 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිටු 121-123

21 එම: පිට. 123.



සටන් අතර මරණයට පත් වූ අතර[22], තවත් පිරිසකට ඉංග්‍රීසීන් විසින් අල්ලා මරණීය දණ්ඩනය පැන වූහ. තවත් පිරිසක් බන්ධනාගාර ගත කිරීම හෝ රටින් පිටුවහල් කිරීම සිදු විය. ඇතැම් සටන් නායකයන් සදාකාලිකවම සැඟවුණු ජීවිතයක් ගත කළහ. ඇතැම් අවස්ථාවල දී මොවුන්ගේ දේපළ ආදිය කොල්ල කා ඇති අතර ගිනිතබා විනාශ කිරීම ද සිදුව තිබේ.[23]



CEYLON
GOVERNMENT GAZETTE
NUMBER 851. COLOMBO:—SATURDAY, JANUARY 10, 1818.

PROCLAMATION.

Govt. Advertisement

Govt. Advertisement.

Advertisement.

Proclamation.

Sale by Auction.

01. ඡායාරූපය - කැප්පෙටිපොළ ඇතුළු උඩරට ප්‍රධානීන් කැරැලිකරුවන් ලෙස නම් කරමින් නිකුත් කළ ගැසට් නිවේදනය (1818 ජනවාරි 10)

22 මෙම සිදුවීම් ඇසින් දුටු ජෝන් ඩේවි සඳහන් කරන පරිදි 1818 නිදහස් සටන අවස්ථාවේ දී ලාංකිකයන් 10000ක් වත් අවම වශයෙන් මරණයට පත් වී තිබේ. ඩේවි දුටු ලංකාව, ඇල්ලේපොළ එච්. ඇම්. සෝමරත්න (පරි.), විසිදුනු ප්‍රකාශකයෝ, වැව පාර, බොරලැස්ගමුව, 2013, පිට 293.

23 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිට 237.

නිදහස් අරගලය ඉංග්‍රීසීන් විසින් මර්දනය කළ පසු රාජ සන්තක කළ ඉඩකඩම් හා දේපළ ආපසු නැවත ලබා දුන් අවස්ථා ද දැකිය හැකිය. 1819 නොවැම්බර් මස 13 වැනි දින රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් යටත් විජිත ලේකම් කාර්යාලයේ බැතර්ස්ට් වංශාධිපතිතුමා වෙත යොමු කළ ලේඛනයක ''පසුගිය කැරැල්ලට පසු රාජ සන්තක වුණු ඉඩම් ආපසු බෙදා දීම හා අයිතිවාසිකම් නිරාකරණය කිරීම තවම සම්පූර්ණ වී නැත. එහෙත් දිනෙන් දින මේ කටයුත්ත කරගෙන ගොස් මේ වන විට සුදුසු යයි හැඟුනාවුනට ඉඩම් කොටස් 16ක් දීමට කටයුතු සලසා ඇත. තවත් 43 දෙනෙකුට හෝ ඔවුන්ගේ පවුල්වලට අයත්ව තිබුණු ඔප්පු ආපසු දීමට අදහස් කරමි'' ලෙස ඒ පිළිබඳ තොරතුරු පැවසේ.[24] එහෙත් 1818 නොවැම්බර් මස 21 දින බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් වගන්ති 56කින් යුතුව උඩරට ප්‍රදේශවලට ඒකපාර්ශවීයව පැන වූ රාජාඥාවේ (නව ආණ්ඩුක්‍රමයේ) 20 වැනි වගන්තිය ප්‍රකාරව එසේ රාජසන්තක කරන ලද ඉඩම් ආපසු පවරා දීමේ දී ඒ ඉඩම්වලින් වාර්ෂිකව අස්වැන්නේ 1/5ක බද්දක් අය කර ගැනීමට නියම කොට තිබේ.[25] අලමුල්ලේ මහ බැත්මේරාළ 1824 දී සිර අඩස්සියෙන් නිදහස් වන විට රාජසන්තක කළ ඉඩම් නැවත ලබා දීම, මුරුසි දිවයිනට පිටුවහල් කළ ඊරියගම රටේ මහත්මයාගේ රාජසන්තක කළ ඉඩම් ඔහුගේ බිරිඳ වූ ඉඹුල්දෙණියේ කුමරිහාමිට පවරා දීම, නිදහස් සටන අවස්ථාවේ දී නාලන්දාවේ දී මරා දැමූ හන්නස්ගෙදර මොහොට්ටාලගේ රාජ සන්තක කළ දේපළ මවට, සහෝදරයෙකුට සහ සහෝදරියට පවරා දීම ඒ සඳහා උදාහරණ කිහිපයකි.[26] නිදහස් සටන හා සම්බන්ධ වූ උඩරට ප්‍රධානීන් හා පවුල්වල සාමාජිකයන් උපායශිලීව තම පාර්ශවය වෙත දිනා ගැනීම (මතුවට නැවත සතුරු නොවීමට වග

24 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිට 403.

25 එහෙත් නිදහස් සටන අවස්ථාවේ ඉංග්‍රීසීන්ට පක්ෂව සිටි පළාතවලින් හා කෝරලවලින් අය විය යුතු බද්ද වාර්ෂිකව අස්වැන්නෙන් 1/14 දක්වා අඩු කිරීමට රාජ ආඥාවේ 19 වන වගන්තියෙන් නියම කර ඇත. ඩේවි දුටු ලංකාව, ඇල්ලේපොළ එච්. ඇම්. සෝමරත්න (පරි.), විසිදුනු ප්‍රකාශකයෝ, වැව පාර, බොරලැස්ගමුව, 2013, පිට 443.

26 මනතුංග බණ්ඩාර, මනතුංග අනුර, 1818 ජාතික නිදහස් අරගලයේ පුරෝගාමීයෝ, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 2011, පිටු 5, 11, 87.



බලා ගැනීම) එහි යටි අරුත වූ බව ඉංග්‍රීසීන්ගේ උපාය උපක්‍රම පිළිබඳ විමසීමේ දී මනාව පැහැදිලි වේ.

මෙරට ඉතිහාසයේ සෑම ජාතික ව්‍යවසන අවස්ථාවකදීම භික්ෂූන් වහන්සේ පෙරමුණ ගෙන ක්‍රියා කළ පරිදිම 1818 නිදහස් සටන අවස්ථාවේ දී ද භික්ෂූන් වහන්සේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කළහ. දළදා වහන්සේ නිදහස් සටන අවස්ථාවේ දී දළදා මාලිගයෙන් රහසින් පිටමං කොට සටන් නායකයන් වෙත ලබාදීම උන්වහන්සේලාගෙන් සිදු වූ වැදගත් කර්තව්‍යකි.[27] නමුත් නිදහස් සටනේ අසාර්ථකත්වයත් සමඟ ඊට සක්‍රියව දායක වූ භික්ෂූන් වහන්සේලාට අත් වූ ඉරණම වූයේ ඉංග්‍රීසි අත්අඩංගුවට පත්ව යාපනය බන්ධනාගාරයේ සිරදඬුවම් විඳීමට සිදුවීමයි. යාපනය වැනි උඩරට ප්‍රදේශවලින් ඉතා දුර බැහැර, හින්දු ආගමික ද්‍රවිඩ ජාතිකයන් වාසය කරන ප්‍රදේශයක උන්වහන්සේලා සිරගත කිරීම ද ඉංග්‍රීසීන් බොහෝ දුර දිග බලා කළ කටයුත්තක් බව පෙනේ. එලෙස නිදහස් සටන හා සම්බන්ධ වීම නිසා යාපනය බන්ධනාගාරයේ සිර දඬුවම් විඳි භික්ෂූන් වහන්සේලා විසි දෙනෙකගේ පමණ තොරතුරු සත් කෝරලේ වැඩ බලන ඒජන්ත තැන වන ඩබ්ලිව්. මර්ෆිගේ අත්සනින් නිකුත් කළ ලිපියකින් අනාවරණය වේ. ඒ මෙසේය, [28]

01. නාපේ තෙරුන්නාන්සේ
02. පල්ලේගම තෙරුන්නාන්සේ
03. මැදගම මහ තෙරුන්නාන්සේ
04. වාරියපොල මහ තෙරුන්නාන්සේ [29]
05. මුප්පනේ තෙරුන්නාන්සේ
06. හුළුගල්ලේ තෙරුන්නාන්සේ [30]

27 එමඃ ix

28 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිටු 176-177.

29 අස්ගිරි පාර්ශවයේ හිමි නමකි, අස්ගිරි මහා විහාරයේ ඉඳවලුගොඩ ධම්මපාල මහනායක ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍යයෙකු ලෙස පැවිදි විය. 1821 අප්‍රේල් මාසයේ දී නිදහස ලැබූ පසු ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා විසින් උන්වහන්සේට දරාණේ විහාරය හා ඊට අයත් ගම්බිම් පූජා කළ බව සඳහන් වේ.

30 අස්ගිරි පාර්ශවයේ හිමි නමකි.

07. අඹගල්ලේ තෙරුන්නාන්සේ [31]

08. පොල්වත්තේ මහ තෙරුන්නාන්සේ

09. බදුලුවෙලේ තෙරුන්නාන්සේ [32]

10. ඊතණවත්තේ මහ තෙරුන්නාන්සේ

11. කළුවරගස්වැවේ මහ තෙරුන්නාන්සේ

12. වඩුපොළ මහ තෙරුන්නාන්සේ

13. කැටකුඹුරේ තෙරුන්නාන්සේ

14. ගල්කඩවෙල මහ තෙරුන්නාන්සේ

15. බමුණුගෙදර මහ තෙරුන්නාන්සේ

16. වල්පලුවේ තෙරුන්නාන්සේ

17. අන්දරවැවේ තෙරුන්නාන්සේ

18. ගල්කඩවල සාමණේර උන්නාන්සේ

19. දඹරාවේ තෙරුන්නාන්සේ

20. අඹතලේ මහ තෙරුන්නාන්සේ

වාරියපොල මහ තෙරුන්නාන්සේට හා හුළුගල්ලේ තෙරුන්නාන්සේට ආවතේවකරුවන් සිටි බව සඳහන් වේ. තවත් ලේඛනයක අස්ගිරි පාර්ශවයේ යාපනය බන්ධනාගාරයේ සිර දඬුවම් විඳිමින් සිටි මොනරවානේ උන්නාන්සේ නම් හිමිනමක් බන්ධනාගාරය තුළ දී අපවත් වූ බව සඳහන් වේ.[33]

කොළඹ හා ගාල්ල යන ස්ථානවල ද නිදහස් සටනේ විරුවන් රැසක් සිරගත කොට තබන ලදී. 1819 පෙබරවාරි මස 01 වන දින බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා වෙත බැතර්සිට් වංශාධිපති විසින් එවන ලද ලිපියක "කැරැල්ල ඇති කිරීම සඳහා තම බලය යොදාගත් සියලුම අධිපතීන් උඩරට පළාත්වලින් ඉවත් කොට, ඔවුන්ගේ ද්‍රෝහීකමට පාත්‍ර

31 අස්ගිරි පාර්ශවයේ හිමි නමකි. 1818 ඔක්තෝම්බර් 26 වන දින අත්අඩංගුවට ගෙන බදුල්ලට ගෙනවිත් ඇත. ඇඳ සිටින සිවුර නොසලකා මරණ දඬුවම දිය යුතු බව සෝයර්ස් විසින් ඩොයිලි වෙත දන්වා එවනු ලැබ ඇතත්, පසුව යාපනයේ සිර අඩස්සියේ රඳවා තබනු ලැබීය.

32 අස්ගිරි පාර්ශවයේ හිමි නමකි.

33 මනතුංග බණ්ඩාර, මනතුංග අනුර, 1818 ජාතික නිදහස් අරගලයේ පුරෝගාමියෝ, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 2011, පිට 72.



වූ ප්‍රදේශයට යළිත් පැමිණීම වළක්වනු පිණිස කළ හැකි හැම දෙයක්ම කිරීම යෙහෙකි" යැයි ප්‍රකාශ කොට තිබේ.[34] ඉංග්‍රීසීන් විසින් නිදහස් සටනේ නායකයන් රැසක් උඩරට ප්‍රදේශවලින් දුර බැහැර යාපනය, ගාල්ල, කොළඹ වැනි ප්‍රදේශවල සිර අඩස්සියේ රඳවා තැබීමටත් ඇතැම් මුල් පෙළේ නායකයන් රටින් පිටුවහල් කිරීමත් සිදු කළේ මෙම පරමාර්ථය ඉටුකර ගැනීමට බව පෙනේ.

එසේ කොළඹ කොටතේනේ නිවාස අඩස්සියේ සිටිය දී මිල්ලව වෙල්ලස්සේ දිසාව 1821 අගෝස්තු 20 වන දින මරණයට පත් වී තිබේ.[35] පහළවෙළ දිව නිලමේ, බකිණිගහවෙල පුංචි රාල, නාවෙල්ගොඩ ආරච්චි, දියකෙළිනවල රටේ මහත්මයාගේ පුත්‍රයා, උඩපළාතේ විදානේ වැන්න වුන්ද සිර අඩස්සියේ සිටියදීම සඳහටම සිය දෙනෙත් පියා ගත්හ.[36] සිර අඩස්සියේ රඳවා සිටි ඇතැම් නායකයන් උඩරට ප්‍රදේශවල තත්ත්වය සම්පූර්ණයෙන්ම යහපත් වූ පසු නිදහස් කිරීමට කටයුතු කොට තිබේ. ගාල්ලේ සිර අඩස්සියේ රඳවා සිටි බකිණිගහවෙල මද්දුමඅප්පු 1823 ජනවාරි මස 01 දින සහ වෙල්අරාවේ මහබැත්මේරාල 1823 අප්‍රේල් මස 13 වැනි දින නිදහස් කිරීම ඊට නිදසුන් වශයෙන් දැක්විය හැකිය.[37]

ඉංග්‍රීසීන්ගේ අත්අඩංගුවට පත් සටන් නායකයන් රැසකට අත් වූ ඉරණම වූයේ මරණීය දණ්ඩනයට යටත් කිරීමයි. 1818 නිදහස් සටනේ ආරම්භක නායකයෙකු වූ බූටාවේ රටේ රාල මේජර් කොක්සන් ඇතුළු පිරිසක් විසින් 1818 සැප්තැම්බර් මස 02 දින රාත්‍රියේ දී වැදිරට මාරගල කන්ද අසල දී අත්අඩංගුවට ගෙන යුද්ධාධිකරණය හමුවට පමුණුවා ඔක්තෝම්බර් මස 20 වන දින කොටබෝවේ දී එල්ලා මරා දමනු ලැබීය.[38] නිදහස් අරගලයේ අසාර්ථකත්වය හමුවේ නුවරකලාවියේ පරවහගමට

34 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිට 407.

35 මනතුංග බණ්ඩාර, මනතුංග අනුර, 1818 ජාතික නිදහස් අරගලයේ පුරෝගාමියෝ, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 2011, පිට 69.

36 එම: 13-87.

37 එම:

38 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිට 357.

පසු බැස සිටි කැප්පෙටිපොළ මහ නිලමේ ද 1818 ඔක්තෝම්බර් මස 28 වන දින ලුතිනල් විලියම් ඔනිල් විසින් අත්අඩංගුවට ගෙන යුද්ධාධිකරණය හමුවට පමුණුවා නොවැම්බර් මස 26 වන දින බෝගම්බර දී හිස සිඳ ජීවිතක්ෂයට පත් කරන ලදී. එලෙස කැප්පෙටිපොළ මහ නිලමේගේ හිස සිඳ ජීවිතක්ෂයට පත් කළ දිනයේ පූර්ව සිදුවීම් පිළිබඳ දොස්තර හෙන්රි මාෂල්ගේ විස්තරය සිත වික්ෂෝප කරවන්නකි.[39] ඔහු කර ඇති විස්තරය අනුව හිස ගසා දැමීමට නියමිත දිනයේ අලුයම කැප්පෙටිපොළ මහ නිලමේ· ඔහුගේ ඉල්ලීම අනුව දළදා මැදුර වෙත කැඳවාගෙන යාමෙන් පසු, දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින කුටියේ දොරකඩ දණ ගසා හිඳගෙන ස්වාමීන් වහන්සේ අබිමුව තමා විසින් මේ ආත්මයේ දී රැස් කරගත් පුණ්‍යකර්ම සම්භාරයක් මෙනෙහි කිරීමේ යෙදුණි. ඊළඟට ඔහුගේ ප්‍රාර්ථනාව වූයේ හිමාල වනයේ දෙවි කෙනෙකුව ඉපිද කෙළවර අමාමහ නිවන් දැකීමට හේතු වාසනා වේවා යනුවෙනි.[40] බොහෝ වේලාවක් දණ ගසාගෙන සිටි දිසාව නැඟී සිට සෝයර්ස් මහතා[41] දෙස හැරී ''මම අවසන් වරට කරන පූජාවෙන් කොටසක් ඔබට ද ලැබේවා'' යි පවසා හිණ බැඳ සිටි තුප්පොට්ටිය ගලවා දළදා වහන්සේට පූජා කරමින් ''මෙය කිළිටිව අපවිත්‍රව තිබුණත් මා සතු එකම වස්තුව මෙය බැවින් ඉන් ලැබෙන කුසලතාව අතිමහත් ය'' යනුවෙන් පවසා වධක භූමිය වෙත ගමන් කොට තිබේ. මේ අවස්ථාවේ දී මඳකුදු නොසැලී ආත්ම ධෛර්යයෙන් සිටි කැප්පෙටිපොළ දිසාව තමන් සමඟ මරණීය දණ්ඩනයට නියමව සිටි මඩුගල්ලේ නිලමේගේ බියසුළුකම ගැන කම්පා වී ''මඩුගල්ලේ මෝඩයෙක් මෙන් හැසිරෙන්නේ යැයි'' ද පවසා තිබේ. පසුව වධක භූමිය වෙත ගිය කැප්පෙටිපොළ නිලමේ මුහුණ අත්පා සෝදාගෙන, ස්වල්ප වේලාවක් ආගමික වතාවත්වල යෙදී, ඉන් පසු කෙස්වැටිය හිස මුදුන් කොට බැඳ අසල වූ පඳුරු දෙකක සිය දෙපා මහපටැඟිලි පටලවාගෙන බිමට නැඹුරු වී, ඔහුගේ හිණ රැඳි සළුව


39 හේමපාල නුවරඑළියේ, සිරිලක සිරි විදෙස් ඇසින්, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මරදාන පාර, පුංචි බොරැල්ල. 2005, පිටු. 119-121

40 එම:

41 සෝයර්ස් මහතා ඌවේ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත ධුරය දරද්දී කැප්පෙටිපොළ මහ නිලමේ දිසාවේ නිලය දැරීම නිසා ඔවුන් අතර සමීප මිත්‍රත්වයක් පැවතුණි.



තුළින් කුඩා බණ පොතක් (ධම්මපදය) ගෙන ඉන් ගාථා කීපයක් කියවා ඒ අසල සිටි සිංහල භේවායෙකුට කතා කොට ඒ පොත සෝයර්ස් මහතාට ලබා දෙන ලෙස පැවසීය. ඉන් පසු කැප්පෙටිපොළ දිසාව හඬ නගා පාලි ගාථා කියමින් සිටියදී ගහලයා මුවහත් කඩුවෙන් ගෙල පසුපසට පහර දුන්නේය. එම මොහොතේ දී බුදුන් වහන්සේ හඳුන්වන 'අරහං' යන වදන ඔහුගේ මුවින් පිටවුණා පමණි. දෙවන වරට දුන් පහරින් ඔහුගේ ප්‍රාණය නිරුද්ධ වී සිරුර මළකඳක් ලෙස දෙරණ මත පතිත විය. ඔහුගේ සිරස සිරුරෙන් වෙන් කොට උඩරට සිරිත අනුව පපුව මත තබන ලදී.[42] කැප්පෙටිපොළගේ හිස් කබල ඉහත විස්තරය සිදු කළ හෙන්රි මාෂල් විසින් ලංකාවෙන් ගෙන ගොස් ස්කොට්ලන්තයේ එඩින්බරෝ කෞතුකාගාරයේ කපාල විද්‍යා සංගමය වෙත භාර දී ඇත.[43] (02. ඡායාරූපය)



02. ඡායාරූපය - බ්‍රිතාන්‍යය විසින් 1948 පෙබරවාරි මස 09 දින ලංකා ආණ්ඩුව වෙත නැවත භාර දුන් කැප්පෙටිපොළ දිසාවේගේ හිස් කබල ප්‍රදර්ශනයට තබා තිබූ අයුරු

42 හේමපාල නුවරඑළියේ, සිරිලක සිරි විදෙස් ඇසින්, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මරදාන පාර, පුංචි බොරැල්ල. 2005, පිට 124.

43 බ්‍රිතාන්‍යය විසින් 1948 පෙබරවාරි මස 09 දින ලංකා ආණ්ඩුව වෙත නැවත කැප්පෙටිපොළ දිසාවේගේ හිස් කබල භාර දෙනු ලැබූ අතර, පසුව එය දළදා මාලිගය ඉදිරිපස භූමියේ තැන්පත් කෙරුණි.

කැප්පෙටිපොළ මහ නිලමේ සමග මඩුගල්ලේ උඩගබඩා නිලමේගේ ද හිස සිඳ ජීවිතක්ෂයට පත් කරනු ලැබීය. එමෙන්ම ඊට මසකට පෙර (1818 ඔක්තෝම්බර් 27) දින ඇල්ලේපොල මහ නිලමේ ද බෝගම්බර දී හිස සිඳ ජීවිතක්ෂයට පත් කරනු ලැබ ඇත. එහි දී යුද්ධාධිකරණය ඔහුව එල්ලා මැරීමට නියම කළත්, එල්ලා මැරීම තම තත්ත්වයට නොගැලපෙන හෙයින් හිස සිඳ මරා දමන ලෙසත්, සිය සිරුර කැබලිවලට කපා බලු කපුටන්ට දන් දෙන ලෙසත් ඔහු අභීතව පවසා තිබේ.[44] යුද්ධාධිකරණය විසින් මරණ දඬුවම නියම කළ නිදහස් සටනේ මුල් පෙලේ නායකයෙකු වූ කිවුලේගෙදර මොහොට්ටාලේව ද 1818 දෙසැම්බර් 18 වන දින බදුල්ලේ දී හිස සිඳ ජීවිතක්ෂයට පත් කරනු ලැබීය.[45] මරණ දණ්ඩනය නියම වූ ඊරියගම කළුබණ්ඩා නැමැත්තා සිය දඬුවම ක්‍රියාත්මක කිරීමට පෙර සිය දිවි හානි කොටගෙන තිබේ. අලුත්නුවර නයිදේරාල, ඉඩමේගම ගංඇතිරාල, කළුගල්පිටියේ විදානේ, කුඩා බදුලුගම්මන රටේ රාල, තැන්නේවත්තේ දිසාව, කඳුකර ආරච්චි, බොරගොග්ගේ මොහොට්ටාල, මාවතගම නිලමේ, වෙල්අරාවේ රටේ රාල, හක්මන තැන්නේවත්තේ නිලමේ, හත්නස්ගෙදර මොහොට්ටාල, හිග්ගහලත්දේ විදානේ නිදහස් සටන වෙනුවෙන් සිය ජීවිතය මරණ දඬුවමට කැපකළ තවත් කිහිප දෙනෙකි.[46]

ඉංග්‍රීසීන් විසින් පැවැත් වූ යුද්ධාධිකරණ මගින් මරණ දඬුවම පැණවූ ඇතැම් නායකයින්ගේ එම දඬුවම පසුව වෙනස් කොට රටින් පිටුවහල් කිරීම ද සිදු විය. නිදහස් සටනේ නායකයන් විසිහතර දෙනෙකු පමණ 1819 පෙබරවාරි මස 24 වන දින රාජකීය ලිවර්පූල් නෞකාවෙන් මුරිසි දිවයිනට එලෙස පිටුවහල් කොට තිබේ.[47] (01. වගු සටහන)

44 මනතුංග බණ්ඩාර, මනතුංග අනුර, 1818 ජාතික නිදහස් අරගලයේ පුරෝගාමීයෝ, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 2011, පිට 08.

45 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිට 270.

46 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිටු 148-150 සහ මනතුංග බණ්ඩාර, මනතුංග අනුර, 1818 ජාතික නිදහස් අරගලයේ පුරෝගාමීයෝ, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 2011, පිටු 06 - 73.

47 බණ්ඩාරනායක රාජා සී. දිසා, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද



| | සටන් නායකයාගේ නම | පිටුවහල් කරන ලද කාල සීමාව | පසු තොරතුරු |
|---|---|---|---|
| 01. | අඹගස්පිටියේ නිලමේ | ජීවිතාන්තය තෙක් | 1831 නොවැම්බර් 06 දින මුරිසියේ දී මරණයට පත් විය. |
| 02. | ඉහගම උන්නාන්සේ | ජීවිතාන්තය තෙක් | 1832 ජූලි 27 දින නිදහස ලබා හෙක්ටර් නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 03. | ඊරියගම නිලමේ | ජීවිතාන්තය තෙක් | 1825 මැයි මස 18 දින පෙනහලු ඉදිමීමේ රෝගය නිසා මුරිසියේ දී මරණයට පත් විය |
| 04. | ඊරියගම රටේ මහත්මයා | අවුරුදු 7කට | 1825 අගෝස්තු 05 දින නිදහස් වී බ්‍රිග්මාරියා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 05. | කැටකුඹුරේ හිටපු රටේ මහත්මයා | අවුරුදු 5කට | 1825 අගෝස්තු 05 දින නිදහස් වී බ්‍රිග්මාරියා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 06. | කුරුකොහොගම කිරිබණ්ඩා | ජීවිතාන්තය තෙක් | 1820 ජූලි මස 11 දින පාචනය රෝගය නිසා මුරිසියේ දී මරණයට පත් විය |

උඩරට සිරකරුවන් පිළිබඳ සංඥරය, විජිත යාපා ප්‍රකාශන, යුනිටි ප්ලාසා, ගාලු පාර, කොළඹ 04, 2010, පිට 439.

| | | | |
|---|---|---|---|
| 07. | කෙම්පිටියේ කෝරාල | අවුරුදු 7කට | 1824 නොවැම්බර් 16 දින නිදහස් වී සිමන්ඩ්‍රා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 08. | කොහුකුඹුරේ රටේ රාල | ජීවිතාන්තය තෙක් | 1825 ජූනි මස 20 දින මුරිසියේ දී මරණයට පත් විය. |
| 09. | ගොඩේගෙදර අදිකාරම් | ජීවිතාන්තය තෙක් | 1832 ජූලි 27 දින නිදහස ලබා හෙක්ටර් නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 10. | තලගුණේ වනක්කු නිලමේ | අවුරුදු 5කට | 1819 දෙසැම්බර් මස 20 දින කොළරාව රෝගය නිසා මුරිසියේ දී මරණයට පත් විය. |
| 11. | දන්ගමුවේ මොහොට්ටාල | ජීවිතාන්තය තෙක් | 1823 සැප්තැම්බර් මස 17 දින පාචනය රෝගය නිසා මුරිසියේ දී මරණයට පත් විය. |
| 12. | දේදුනුපිටියේ මොහොට්ටාල | අවුරුදු 7කට | 1822 සැප්තැම්බර් මස 28 දින වියපත් වීමෙන් මුරිසියේ දී මරණයට පත් විය. |
| 13. | දෙමෝදර මොහොට්ටාල | ජීවිතාන්තය තෙක් | 1824 නොවැම්බර් 16 දින නිදහස් වී සිමන්ඩ්‍රා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |



| | | | |
|---|---|---|---|
| 14. | පිළිමතලාවේ නිලමේ | ජීවිතාන්තය තෙක් | 1832 සැප්තැම්බර් 16 දින නිදහස් වී ඇට්වික් නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 15. | මත්තෙමගොඩ කුන්කෝරළයේ දිසාව | ජීවිතාන්තය තෙක් | 1825 ජූනි මස 27 දින වාතාබාධයකින් මුරිසියේ දී මරණයට පත් විය. |
| 16. | මීගහපිටියේ රටේ රාල | ජීවිතාන්තය තෙක් | කලක් රොගීව සිට 1831 නොවැම්බර් මස 06 දින මුරිසියේ දී මරණයට පත් විය. |
| 17. | මීවතුරේ හිටපු ලේකම් | ජීවිතාන්තය තෙක් | 1821 නොවැම්බර් මස 08 දින මුරිසියේ දී මරණයට පත් විය. |
| 18. | රාහුපොළ පිහනරාල | අවුරුදු 5කට | 1824 නොවැම්බර් 16 දින නිදහස් වී සිමන්ඩ්‍රා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 19. | වැත්තෑවේ හිටපු රටේ රාල | අවුරුදු 6කට | 1824 නොවැම්බර් 16 දින නිදහස් වී සිමන්ඩ්‍රා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 20. | හාපත්ගම මොහොට්ටාල (ජ්‍යොෂ්ඨ) | ජීවිතාන්තය තෙක් | 1826 ජනවාරි මස 19 දින බීමත්කමට ඇබ්බැහිවීම නිසා මුරිසියේ දී මරණයට පත් විය. |

| | | | |
|---|---|---|---|
| 21. | හාපත්ගම මොහොට්ටාල (කනිෂ්ඨ) | ජීවිතාන්තය තෙක් | 1822 දෙසැම්බර් මස 22 දින පාචනය රෝගය නිසා මුරිසියේ දී මරණයට පත් විය. |
| 22. | වලපාගොල්ලේ මුහන්දිරම් | අවුරුදු 5කට | 1825 අගෝස්තු 05 දින නිදහස් වී බ්‍රිග්මාරියා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 23. | පිටවල ලේකම් නිලමේ | අවුරුදු 5කට | 1825 අගෝස්තු 05 දින නිදහස් වී බ්‍රිග්මාරියා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |
| 24. | වත්තේකැලේ මොහොට්ටාල | අවුරුදු 7කට | 1824 නොවැම්බර් 16 දින නිදහස් වී සිමන්ඩ්‍රා නෞකාවෙන් ලංකාව බලා පැමිණ ඇත. |

01. වගු සටහන - රාජකීය ලිවර්පූල් නෞකාවෙන් මුරිසියට පිටුවහල් කළ නිදහස් සටනේ නායකයන්

ඉතා උද්යෝගයෙන් නිදහස් සටන හා සම්බන්ධ වූ කනවැරැල්ලේ රටේ රාල ද මුරිසි දිවයිනට රාජකීය ලිවර්පූල් නෞකාවෙන් පිටුවහල් කිරීමට නියමිතව තිබුණත් ඊට පෙර මරණයට පත් වී තිබේ.[48] 1818 නිදහස් සටන අවස්ථාවේ දී බලහත්කාරයෙන් මහනුවරින් පිටමන් කරනු ලැබ කොළඹ කොටුවේ නිවාස අඩස්සියේ වසර හතක් කිසිදු චෝදනාවක් නොමැතිව සිරකර තැබූ ඇහැලේපොල මහ නිලමේ ද 1825 වර්ෂයේ දී මුරිසි දිවයිනය පිටුවහල් කිරීම දෛවෝපගත සිදුවීමකි. ඔහු ද 1829 අප්‍රේල් මස 05 වන දින මුරිසියේ දී මරණයට පත් විය.[49] (03. ඡායාරූපය)

48 මනතුංග බණ්ඩාර, මනතුංග අනුර, 1818 ජාතික නිදහස් අරගලයේ පුරෝගාමියෝ, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 2011, පිට 17.

49 බණ්ඩාරනායක රාජා සී. දිසා, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය, විජිත යාපා ප්‍රකාශන, යුනිටි ප්ලාසා, ගාලු පාර, කොළඹ 04, 2010, පිටු 267-295.






03. ඡායාරූපය - කන්ද උඩරට සිරකරුවන් මුරිසි දිවයිනේ නේවාසිකව සිටි ගොඩනැගිල්ල (වර්තමාන තත්ත්වය)

1818 අගෝස්තු - සැප්තැම්බර් වන විට නිදහස් සටන සම්පූර්ණයෙන්ම අසාර්ථකත්වය පත් වීමේ ස්වභාවයක් දිස් වූ නිසා ඇතැම් සටන් නායකයන් ගත් තීරණය වූයේ ඉංග්‍රීසීන්ගේ නිවේදන අනුව යටත් වීමයි. අකුරැකඩුවේ මොහොට්ටාල 1818 සැප්තැම්බර් මස 20 වන දින තවත් පස් දෙනෙක් සමග ද, එදින ම පලාගොල්ලේ මොහොට්ටාල ද, අමුණුමුල්ලේ මොහොට්ටාල ඔක්තෝම්බර් 14 දින ද, මාලියද්දේ මොහොට්ටාල ඔක්තෝම්බර් 24 දින ද, කම්බුවටවන මොහොට්ටාල ඔක්තෝම්බර් 29 වන දින ද, කදුලව ලොකු මොහොට්ටාල නොවැම්බර් 20 දින ද වශයෙන් සටන් නායකයන් රැසක් ඉංග්‍රීසීන්ට ස්ව කැමැත්තෙන්ම යටත් වී තිබේ.[50] තවත් පිරිසක් ප්‍රධාන සටන් නායකයන් ඉංග්‍රීසීන්ට හසු වී මරණීය දණ්ඩනයට පවා ලක්ව, සටන නිමාවට පත්ව

50 මනතුංග බණ්ඩාර, මනතුංග අනුර, 1818 ජාතික නිදහස් අරගලයේ පුරෝගාමියෝ, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 2011, පිට 1-67.

තිබිය දීත් තවදුරටත් සැඟවී සිටීමට කටයුතු කර තිබේ.[51] 1818 නිදහස් සටන අවස්ථාවේ දී රාජ ප්‍රතිරූපකයා වශයෙන් පෙනී සිටි විල්බාවේ[52] ද එලෙස 1830 දක්වා ඉංග්‍රීසීන්ගෙන් සැඟව සිටීමට සමත් විය. පසුව විල්බාවේ ඉංග්‍රීසීන්ගේ අත්අඩංගුවට පත් වූ අතර, දීර්ඝ නඩු විභාගයකින් පසු නිදහස් කරනු ලැබීය.[53] විල්බාවේ ඉංග්‍රීසීන්ගෙන් සැඟව සිටින සමයේ දී ණය මුදලක් ඉල්ලා කරගම්පිටිය සුබෝධාරාමයේ නායක හිමියන්ට එවන ලද ලිපියක් තවමත් එම විහාරයේ සුරක්ෂිතව පවතී. (04. ඡායාරූපය)



04. ඡායාරූපය

විල්බාවේ විසින් ණය මුදලක් ඉල්ලා එවන ලද ලිපිය

51 1819 ජුලි මස 10 වැනි දින විටත් යටත් නොවී සිටි හපත්ගම මහ මොහොට්ටාල, රහුල්බද්දේ විදානේ, හත්පන්ගුවේ මොහොට්ටාල, මැදපෝරුවේ රටේ රාල, ගලහිටියාවේ කෝරාල, පතනගෙදර පිහරාල වැනි සටන් නායකයන් විසිපස් දෙනෙකුගේ නම් ලැයිස්තුවක් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් ප්‍රකාශයට පත් කර තිබේ. විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිට 130.

52 රාජාධි රාජසිංහ රජුගේ ඥාතිවරයෙකු වූ දොරේසාමි කුමරු ලෙස පෙනී සිටියත් පසුව ඔහු සැබෑ රාජවංශිකයකු නොවන බවත් පැවිදි වී සිට උපවැදි වූ සත්කෝරළයේ වැසියකු බවත් හෙළි විය.

53 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිටු 1-40.



## සාරාංශය

1818 දී සිංහලයේ නිදහස වෙනුවෙන් ඌව වෙල්ලස්ස කේන්ද්‍ර කරගනිමින් සටන් කළ නායකයන්ට අත් වූ ඉරණම පිළිබඳ විමසා බැලීමේ දී ඇතැම් නායකයන් සටන් අතරතුර දී මරණයට පත් වූ අතර, තවත් පිරිසක් ඉංග්‍රීසීන්ගේ අත්අඩංගුවට පත් ව බන්ධනාගාරගත ව සිර දඬුවම් විඳි අතර, අත්අඩංගුවට ගත් ඇතම් අය මරණීය දණ්ඩනයට ලක් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම ද සිදු විය. 2018 වසරට එම ඌව වෙල්ලස්ස නිදහස් සටනට වර්ෂ 200ක් සම්පූර්ණවන අවස්ථාවේ දී එකී සටනේ සියලු තරාතිරමේ සටන් නායකයන් ස්මරණය කිරීම කලගුණදත් ජාතියක වගකීමක් ද යුතුකමක් ද වන්නේය. නිදහස් සටනේ පුරෝග ාමියෙක් වූ ඇල්ලේපොළ මහ නිලමේගේ භාර්යාාව ඉහගම පරපුරට අයත් කුලවත් කාන්තාවකි. ඇය 1819 ඔක්තෝම්බර් මස වසූරිය රෝග යෙන් මරණයට පත් වූවාය. වස්ත්‍රයකින් පවා නොවසන ලද ඇයගේ මෘත ශරීරය රාජ පුරුෂයෙකු විසින් දක්නා ලදින් රික්ස් ඩොලර් අටක් රජයෙන් වියදම් කොට කිසිවෙකුත් නැති අසරණියක සේ වළලා දමන ලදී.[54] කැප්පෙටිපොළ නිලමේගේ භාර්යාාව වූයේ දෙල්වල එතනහාමි නම් කුල කාන්තාවකි. සටන අවසානයේ ඇය ද සිය පුතුන් දෙදෙනාත් සමගින් හලාවතට යැවීමට ඉංග්‍රීසීන් කටයුතු කරන ලදී.[55] එනිසා සටන් නායකයන්ගේ මව්වරුන්, බිරින්දෑවරුන්, දරුවන් ද සියලු දුක්ගැහැට විඳිමින් රටේ නිදහස වෙනුවෙන් ලබාදුන් දිරිය ද කිසිවිටකත් ජාතියක් වශයෙන් අප අමතක නොකළ යුතුය.

54 විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010, පිට 242.

55 එම: 269.

## ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය


ඇල්ලේපොළ එච්. ඇම්. සෝමරත්න (පරි.), ඩේවි දුටු ලංකාව, විසිදුනු ප්‍රකාශකයෝ, වැව පාර, බොරලැස්ගමුව, 2013, පිට 444.

ජයතිලක හෙළුම්, කන්ද උඩරට සටන් හා ආරක්ෂක විධිවිධාන (ක්‍රි.ව. 1521-1658 දක්වා පෘතුගීසීන් සම්බන්ධව), සමන්ති පොත් ප්‍රකාශකයෝ, හෙට්ටිගම ජා-ඇල, 2013.

ඩබ්. කේ. එම්. විජේතුංග (සංස්:), ශ්‍රී ලාංකේය ඉතිහාසය, හතරවන වෙළුම, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 12, 2012.

බණ්ඩාරනායක රාජා සී. දිසා, දිවයින් අතර (මුරිසියට පිටුවහල් කෙරුණු කන්ද උඩරට සිරකරුවන් පිළිබඳ කතාන්දරය, විජිත යාපා ප්‍රකාශන, යුනිටි ප්ලාසා, ගාලු පාර, කොළඹ 04, 2010, පිට 439.

මනතුංග බණ්ඩාර, මනතුංග අනුර, 1818 ජාතික නිදහස් අරගලයේ පුරෝගාමියෝ, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල, 2011, පිටු 5, 11, 87.

රංග කලන්සූරිය, ප්‍රදීප් එන්. වීරසිංහ (සංස්:), පළමු නිදහස් අරගලයේ ප්‍රත්‍යාවලෝකනය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 05, පිටු 14-15.

විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (දෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010.

විමලානන්ද තෙන්නකෝන්, උඩරට මහ කැරැල්ල (තෙවන කාණ්ඩය), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ඕල්කොට් මාවත, කොළඹ 11, 2010.

සිල්වා කොල්වින් ආර්. ද, බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව (1795-1833), සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගමේ මුද්‍රණය, 1958.

හේමපාල නුවරඑළියේ, උඩරට ගිවිසුම, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, ඇන්. ටී. පෙරේරා මාවත, මුල්ලේරියාව, 2004.

හේමපාල නුවරඑළියේ, සිරිලක සිරි විදෙස් ඇසින්, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුරදාන පාර, පුංචි බොරැල්ල, 2005, පිටු. 119-121

Devy John, ***An Account of the Interior of Ceylon, and of Its Inhabitants: With Travels in that Island***, London, 1821.

Marshall Henry, ***Ceylon: A General Description of the Island and its Inhabitants***, Kandy, 1954.




# සංවර්ධන සන්නිවේදනයේ මූලික අවශ්‍යතා පිළිබඳ සංවර්ධන ප්‍රවේශය හා ප්‍රායෝගික ජන සමාජය

ආර්. ජේ. සඳුනිකා උදානි රත්නායක

20 වන ශතකය ආරම්භයේ පටන් සංවර්ධනය යන්න නිර්වචනය කරන්නට පටන් ගත්තේ දළ දේශීය නිෂ්පාදිතය සහ දළ ජාතික නිෂ්පාදනය කරණ කොටගෙනය. කිසියම් රටක සංවර්ධනයේ මිනුම් දණ්ඩ සේ ලෝකයා පිළිගන්නට වූයේ දළ දේශීය නිෂ්පාදිතය හා එරටේ දළ ජාතික නිෂ්පාදනයයි. එසේ වුවත් ක්‍රමයෙන් 21 වන සියවස ආරම්භයත් සමග සංවර්ධනයේ මිනුම් දණ්ඩ බවට පත්වූයේ එක් එක් රටවල්වල සමාජ, ආර්ථික, සෞඛ්‍ය හා අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින්නා වූ වර්ධනීය තත්ත්වයයි.

සංවර්ධනය සම්බන්ධයෙන් ලොව ප්‍රමුඛ අවධානයක් යොමුවන්නට පටන් ගත්තේ පශ්චාත් දෙවන ලෝක යුධ සමයේදීය. ඒ අනුව දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් අනතුරුව ලොව මහා බලවතුන්ව සිටි ප්‍රමුඛ පෙළේ රටවල්වලට ද, දෙවන ලෝක සංග්‍රාමයෙන් දැඩි ලෙස පීඩාවට පත්වූ රටවලටද සංවර්ධනය සඳහා කිසියම් න්‍යායයික වැදගත්කමක අවශ්‍යතාව මතුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝක අවශ්‍යතාවක් ලෙසින් සංවර්ධනය සඳහා සන්නිවේදනය බිහිවී තිබේ.

සංවර්ධනය සඳහා වන ප්‍රමුඛස්ථානය ඇමරිකාව ආදි බටහිර ප්‍රධාන රටවල් හිමිකර ගනිද්දී ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකාදී රාජ්‍ය සංවර්ධනයේ මුල්ම අවදි තවමත් පසුකරමින් සිටියි. එනම් යටත් විජිතවාදයට ගොදුරුව පැවති රටවල් සංවර්ධනයේ මුල්ම අවදිවල පසුවෙද්දී එකී රටවල පවත්නා සමාජ, ආර්ථික හා දේශපාලනමය ගැටලු වර්තමානය වන විටත් එක සමාන සෘණාත්මක සංවර්ධන තත්ත්වයක් උරුම කරගෙන ඇති බව පෙනේ. ඊට හේතුව වන්නේ යටත් විජිත සමයේ දී එකී රටවල ක්‍රියාකාරිත්වය සහ නිදහස ලැබීමෙන් අනතුරුව ඇතිවූ පශ්චාත් යටත්විජිතකරණය තුළ සැලකිය යුතු මට්ටමේ